28 වන පිටුවෙන්

*විය. තමුන්නාන්සේ විසින්ම මත්පැන් බීමට පුරුදු කරනු ලැබූ මැණිකේද මත්පැන් බීගත් පසු කිසිම බියක් නැතිව නින්දිත දුශ්චරිත කරන්නට පටන් ගත්තීය. මව් පියන් දෙදෙනා තරගෙට මෙන් කරන්නා වූ දුසිරිත් දුටු දූවරුත් පුත්‍රයෝත් කුඩා කාලේ පටන් ඒ දුසිරිත් කරන්ට පුරුදු වූහ.*

සිංහල ජාතියත් බෞද්ධාගමත් නිරන්තරයෙන්ම ඒකානුයාතව පවතින අංශ ද්වයකි. සිංහල ජාතියත් සිංහල සංස්කෘතියත් ඒවාටම අනන්‍ය වූ පිරිසිඳු ලක්‍ෂණවලින් යුතු වන්නේ බෞද්ධාගම තුලින් ලැබූ සංයත බව හා හික්මීම හේතුවෙනි. මේ අදහස් පියදාස සරිසේනයන් නිතරම එළිදැක්වූ බව "සාහිත්‍ය රුචිය හා නවකතා විචාරය" කෘතියේදී මහාචාර්ය ආර්ය රාජකරුණා මෙසේ ප්‍රකාශ කර සිටියි.

*"සිංහල ජාතිය ලෝකයේ උසස්ම ජාතියක් බව හේ විශ්වාස කළේය. ආගම් අතරින් උසස්ම ආගම බෞද්ධාගම බව ප්‍රකාශ කළේය. විදේශීය ආධිපත්‍යට යටත් වීම නිසා පරිහානියට පත් වූ සිංහල ජාතියවත් බුද්ධාගමවත් පුනර්ජීවය සීමට තැත් කළේය."*

නිදසුනක් ලෙස පියදාස සිරිසේනගේම "වාසනාවන්ත විවාහය හෙතවත් ජයතිස්ස හා රොසලින්" කෘතියේදී හමුවන ජයතිස්ස හා වින්ස්ටන් පෙරේරා යන චරිත සැසඳිය හැක.

*"ජයතිස්ස වනාහි නාමයට යෝග්‍ය වූ ගුණ ධර්මයන්ගෙන් හෙබි, සියලු දුෂ්චරිතයන්ගෙන් වැළකුණු, පුණ්‍යවන්ත, ඥාණවන්ත, ජාත්‍යාලයෙන් යුක්ත, සත් කීර්තිමත් උත්තමයෙකි. වින්ස්ටන් පෙරේරා වනාහි ගුණ ධර්ම ගැන තැකීමක් නැති, ස්වකීය අභිමතාර්ථය ඉෂ්ට කර ගැනීම පිණිස ඕනෑම අපරාධයක්කිරීමට පසුබට නොවන දුෂ්ටයෙකි."*

ඉහත චරිත ද්වය හැඳින්වීමට යෙදුනු විශේෂණ පද එම කෘතියේම සඳහන් චරිත විස්තර තුළින් උපුටා ගත් බව මහැදුරු ඒ. වී. සුරවීරයාණෝ ප්‍රකාශ කර සිටිති. මෙවැනි චරිත යෙදීමෙන් සිරිසේන මහතාගේ අභිලාය වූයේ බොදු හැදියාව සහිතව; හෙළ සංස්කෘතියට අනුගතව දිවි ගෙවන පුද්ගලයා පසුපස සාර්ථකත්වය, ජයග්‍රහනය හා සොම්නස හඹා එන බවත් අනර්ථවත් බටහිර සිරිත් කරපින්නා ගෙන, මානයෙන් යුතුව ජීවත් වන්නට වෙර දරන්නන් පරාජය වෙත නිතැතින්ම තල්ලු වන බවත් පෙන්වීමය. "ජයතිස්ස" යන නාමය "ජයග්‍රහණය" යන අරුතත්, බොදු හෙළ බව තීව්‍රව දැක්වෙන "තිස්ස" යන කොටසක් ඇති බැව් අපට විශද වන අතරම වින්සටන් පෙරේරා යන බටහිර නාමයෙන්ම ප්‍රතිවාදීයාගේ ඇති බටහිර ගැති බව විශද කරයි.

"පසන් නිවස" නම් කෘතියේදී ද

*ස්කෝලේ මහත්තයා :- ජාතික හැඟීමය කියන්නෙ කුමක්ද? උත්පත්තියෙන්ම එය ලැබෙන්නේ කොහොමද ?*

*රාමසිංහ :- අපේ රටේ ජාතික ඉගැන්වීම සම්පූර්ණයෙන්ම විනාශව ගොස් අවුරුදු තුන්සියයකට වැඩිය. විදේශික ජානයා විසින් ඔවුන්ගේ පතපොත ඉගැන්විමෙන් සිංහලයාට වූයේ අනතුරු දෙකකි. මොකක්වත් නූගත් "අමුම අමු" සිංහලයෙක්ට ඉන්ට ලැබුණොත් නැත. සිද්ධ වුණේ සිංහලත් නොවන, යුරෝපීයත් නොවන, මරක්කලත් නොවන මේ සියලුම ජාතිවල ගතිගුණවලින් සමන්විත සතෙක් වීමය.*

යැයි ජාතිකත්වය හා ජාතිය හැඟීම පිළිබඳ කරුණු දක්වා ඇත. මේ සෑම අදහසක්ම ජනතාව අතමිට ගෙන යෑමට ජාතික ව්‍යාපාරය විසින් නොයෙක් ක්‍රමෝපායන් අනුගමනය කෙරිණි. දේශ හිතෙෂී පුවත්පත්, දේශන, රැස්වීම් ආදී වූ ඒ ක්‍රම මධ්‍යයේ පියදාස සිරිසේන වැනි ලේඛකයින්ගේ මෙවන් වූ වෑයමද අග්‍රගණ්‍ය බවට අපි ප්‍රශංසා කළ යුතු වෙමු.

පියදාස සිරිසේනයන් අමතරව එම්. සී. එෆ්. පෙරේරා (1872 -1922) මාර්ටින් වික්‍රමසිංහ, ඇල්බර්ට් ද සිල්වා ආදී කතුවරුන්ද ජාතික ව්‍යාපාරයේ ආභාසය ලබා ඇති බැව් ඔවුන්ගෙ කෘති තුළින් අපට විශද වේ. නමුත් උක්ත අදහස්වලට මුලුමනින්ම ප්‍රතිපක්ෂ වෙමින් රචනාවූ සිංහල නවකතාද අපට හමුවේ. පවුල් වෘතාන්ත ලිවීමේ ආරම්භකයා ලෙස සැලකෙන අයිසැක් ද සිල්වාගේ "වාසනාවන්ත හා කාලකන්නි පවුල්" නැමැති (1888) කෘතිය ඊට නිදසුනකි. එහි සඳහන් වන පරිදි වාසනාවන්ත පවුල් වන්නේ කිතුනු ආගමට හැරී බටහිර සිරිතට අනුව හැඩග ෑසෙන පවුලය. බෞද්ධ ආගම සහ සිංහල ජාතිය පිළිබඳව තකමින් ක්‍රියා කරන පිරිසකගේ විවාහ ආසාර්ථක වී පවුල් විනාශ වේ.


ගායනා පන්ති - 2009

පෙබරවාරි මස **08** වැනිද ඇරඹේ

**මෙහෙයවීම –**

සංගීත අධ්‍යක්ෂ
**තරුපති මුණසිංහ**
Bachelor of Arts (Kelaniya), Master of Arts (J'pura),
Diploma in Writer ship & Communication (J'pura)

**ස්ථානය –**

**Thomas Town Library hall.**
52 Main Street Thomastown

**වේලාව -**

සෑම ඉරිදවකම උදෑසන **9.00** සිට ළමුන් සහ වැඩිහිටියන් දෙපාර්ශවයම සඳහා පන්ති පැවැත්වේ.

විමසීම්

(Mobile) **0413745366** / (home) **0359405226** (5 pm - 10 pm)

**එන්න! නිවැරදිව ගයන්න ඉගෙන ගන්න!**


# සංදේශය !

ලෝකයේ බොහෝ රට වලට ඇත්තේ යුද උන්මාදය කි. ඔවුහු ඉන් අප්‍රමාණ සතුටක් ලබති. නිර්භීත බවක් ද පෙන්වන්නට උත්සුක වෙති. මහා පොළොවට වෙන කවරදාකටත් වඩා ආදරය කරති. ඒ වෙනුවෙන්ම අයෙක් දිවි පුදන අතර, අනෙකා ඔහුට තම රට, දැය රැක ගැනීම වස් මරණයට දිරි දෙයි. අනෙකාගේ මරණයට වටිනාකමක් එක් කොට මහජන ප්‍රසාදය මධ්‍යයේ ආවඩයි. ඔවූහූ ජීවිතයෙන් වන්දි ගෙවා අපට ජීවත් වීම සඳහා මහා පොළොව බේරා ගනිති. අප ඔවුනට ජාතියේ ගරු බුහුමන, ප්‍රණාමය හිමි කර දී කිඹුල් කඳුළු හෙළන්නට ද, අසරණ වූ ඔවුනගේ පවුල් ගැන අප්‍රමාණව දුක් සුසුම් හෙළන්නට ද සූදානම් ය. මරණයෙන් මතු එම
අසරණයින්, වීරයින් බවට පත් වෙයි.

එවන් අසරණ වීරයින්ගේ ප්‍රහාරයට ලක් වන්නේ ද තවත් අසරණ මිනිසුන් කොටසක්ම ය. ඔවුන් ද පෙර කර්ම වලට ජීවිත පුද දෙනවා විය යුතුය.

සතුරන් යයි නම් කරන පිරිස කරන්නේ ද එයම ය. තම ජාතිය බේරා ගන්නට යයි උදම් අනමින් ඔවුහු ද විශාල වශයෙන් මිනිස් ඝාතනයෙහි නියැලෙති. අවසන ගත් කල, මිය යන්නේ කව්රුන් හෝ තම සහෝදර වැසියෙකි.

කෙසේ වුවද ඊළඟ ඉලක්කය මා හෝ ඔබම මිස වෙන කව්රුන්ද?

මෙමඟින් මට කියන්නට අවැසි වන්නේ එකම කරුණකි. ඒ කුමන අයුරකින් වුව ද සිදු වන්නේ මිනිස් ඝාතනයන් ය. මම ජීවත් වීමට මිස මරණයට කැමති නොවෙමි. සැබෑව නම් එයම ය. එසේ නම් අනෙකාගේ මරණයට ආවඩන්නට, දිරි දෙන්නට මට අයිතියක් ද නැත.


මීට වසර 15කට පමණ පෙර මා"තින් ලියැවුණු පුංචි කවක් ද සිහි වෙයි.

මිය යන වුනට
යළි
ජීවය දෙන්නට හැකි නම්
මම ද
යුද්ධයට කැමැත්තෙමි..

අද ද යුද්ධය ඇස, කණ ගැටෙන සැම විට එයම සිහි වේ. එහෙත් අද ඒ අදහසට ද මම කැමති නැත. ජීවිතය යළි දෙන්නට හැකි වු විට තව තවත් යුද්ධයම පවතින්නට ඉඩ ඇති බැවිනි. ජීවිතය යනු යුද්ධ කරමින් හිඳ මිය යාම නොවන හෙයිනි.

කරුණු කෙසේ වුවද, ඔබට කියන්නට ඇත්තේ ජීවිතයක වටිනාකම පිළිබඳව කතාව ය. යුද උන්මාදයට නොපෙනෙන, නොදැනෙන ජීවිතයක වටිනාකම පිළිබඳව තවත් සිතිය යුතු බව ය. ඔබට ඔබේ ජීවිතය කෙතරම් වටින්නේ ද, එතරම්ම අනෙකාට තම ජීවිතය වටින්නේ ය. ඔබට ඔබේ පවුලේ, හිතවතුනගේ ජීවිත කෙතරම් වටින්නේ ද, එතරම්ම අනෙකාට තම පවුලේ සහ හිතවතුනගේ ජීවිත වටින්නේ ය. ඔබේ මරණය පිළිබඳව මොහොතක් මෙනෙහි කරන්න. ඔබට දැනෙන ජීවිත ආශාව, මරණ බිය පිළිබඳව ඔබට නොදැනේ ද? අනෙකාට එසේ නොවන්නේ යැයි ඔබට සිතිය හැකිද? කිසිම මවකට යුද්ධයෙන් මිය ගිය තම දරුවාගේ මරණය පිළිබඳව ආඩම්බරයක් හෝ සතුටක් හෝ නොදැනෙණු ඇත. ඒ අම්මාවරු මුලා කරන්නට, ඔවුනගේ සිත් සනසාලන්නට අප දොඩන වහසි බස් පමණක්ම මිස වෙන කුමක් ද?

මරණය සඳහා තම අයවලුන් දිරිමත් කරන්නට අපි කවි, ගීත වැනි විවිධ නිර්මාණ බිහි කරන්නෙමු. කිසිමදාක නැති තරමක ආදරයකින් රට, ජාතිය, ආගම ගැන කතා කරන්නෙමු. එහෙත් අපි පසෙකට වී බලා සිටින්නෝ මිස පෙරමුණ ගෙන යන්නෝ නොවෙමු. විශේෂයෙන් විදෙස්ගතව සිටින




අප වැන්නන් ඉතා පහසුවෙන් කරන්නේ ද එයම ය. ආපසු ගිය දිනෙක සුව සේ හිඳින්නට හැකි වන්නේ එවිටය. එදින එ බිමේ මිය ගිය දහස් ගණන් ජනයාගේ ලේ සුවඳ මැකී ගොස් තිබෙන බව නම් සිකුරු ය. අපට සෙත සදන්නට සතුරු, මිතුරු දෙ පසේ මියගියවුන් පිළිබඳව සිහි කළ යුතු ද නැත. එම සිහින ලොව තනන්නට වීරකම සමඟ මරණයට කැප වීම සඳහා අපි අනෙකාට නිර්ලෝභීව ආවඩමු.

අප කළ යුත්තේ එය නොවන බව සහතිකය. අප කළ යුත්තේ රජයට සහ මහජනතාවට මෙම ප්‍රශ්නය විසඳීම සඳහා වඩාත් සාර්ථක පියවර ගැනීමට බල කර සිටීමය. දේශපාලනික, ආර්ථික වශයෙන් විසඳුම් සපයා දීම සඳහා බල කර සිටීමටය. ඒ සඳහා සහයෝගය ලබා දීමය. සතුරාට එම ප්‍රහාර නවතා දමන්නට බල කර සිටීමය. ඔවුනට ඒ සඳහා (යුද්ධය සඳහා) සහයෝගය නොදී සිටීමය. සාමකාමී රටක් ගොඩ නැගීම සඳහා ජාත්‍යන්තර සහයෝග ය ලබා ගැනීමට හැකි උපකාරයක් කිරීමය. අප කළ යුතුව ඇත්තේ එය මිස ලෝකයම යුද ගින්නෙන් අවුළුවාලීමට පිඹුරුපත් සකස් කිරීම හෝ අමුද්‍රව්‍ය සපයා දීම නොවන්නේම ය.

තෙවැනි ලෝකයේ ලංකාව වැනි රටකට තනිව ක්‍රියා කිරීමේ හැකියාව ඉතා අල්පය. ලෝකයම එකිනෙකා වෙත බැඳුණු වකවාණුවක, ගෝලීයකරණය තුළ අනෙකාගේ සහයෝග ය නොමැතිව රටකට තනිව ඉදිරියට යාමට අපහසු වී ඇත. ඒ දේශපාලනික කපටිකම් නිසාම ය. අවාසනාවට එය හොඳට, නරකට දෙකටම එක සේම බලපාන්නේ ය. එබැවින් මෙම ප්‍රශ්නය මානුෂිකව විසඳා ගැනීමේ දී බලවත් අවි කර්මාන්ත වල ඇති දේශපාලනයට ද යට වන්නට සිදු වනු ඇති. එවන් වූ ජාත්‍යන්තරය ට පාඩමක් උගන්වන්නට නම් කළ අප යුත්තේ, මේ කුළල් කා ගැනීම නවතාලීම ය.

මිනිසුන් වෙනස් වන්නේ ඔවුන්, කරන කියන දෑ තුළින් මිස ජාතික, ආගමික, භාෂා හෝ සුදු, කළු වශයෙන් නොවන බව නොදන්නේ කව්රුන් ද? උපන්දා පටන් යුද්ධයම අත්දකින යාපනයේ වැසියන්, දකුණේ ජනතාව ගැන සිතන්නේද තම ජාතිය, ආගම පිළිබඳ දැඩි බැඳීම් සහ හැඟීම් ඇතිව විය යුතු ය. මෙම ආලක්ප වලට විසඳුම් ලබා දීම, ඔවුනගෙ නැණස පෑදීම සඳහා යමක් කිරීම අපගේ යුතුකම නොවන්නේද? උතුරින් දකුණට ද, දකුණින් උතුරට ද සංදේශ යැවිය යුත්තේ පොත්පත්, කව් ගීත වලට පමණක් සීමා නොකොට, අසීමිත මනුස්සකමේ සුවඳ දවටා මිනිසුන්ට ආදරය කිරීමේ පණිවුඩය සමඟ ය..

නො එසේ නම් දිනෙක,

රුධිරයම පූජා කොට
රුධිරයම හිලව්වට ගෙන
රුධිර ගංගා ගලා ගිය දේශයේ
වසන්නට
කිසිවකු නොවනු ඇත
කිසිවකුම ඉතිරි නොවනු ඇත.

තුෂාරි ප්‍රියංගිකා